1) පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය යන සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

2) නිෂ්පාදන කාර්යක්ෂමතාව යනු කුමක්ද ?

3) යම් ආර්ථිකයක් නිෂ්පාදන කාර්යක්ෂමතාව ලගා කරගැනිමට අත්පත් කර ගත යුතු කොන්දේසි දෙක මොනවාද ?

4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර නිර්වචනය ඉදිරිපත් කරන්න.

5) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර නිර්මාණය කිරිමේදි භාවිතා කරන උපකල්පන 4 ක් දක්වන්න.

6) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර හා ආවස්ථික පිරිවැය අතර සම්බන්ධතාවක් පවතී. ඒ අනුව ආවස්ථික පිරිවැය බෙදා වෙන්කල හැකි ආකාර තුන මොනවාද ?

7) එම ආකාර තුන පස්තාර සටහනකින් ඉදිරිපත් කර එහිදි නි.හැ.මා වකය විවිධ හැඩ ගැනිමට හේතු සඳහන් කරන්න.

8) ආර්ථික පිරිමැසුම් හෙවත් පරිමාණානුකුල ඵල යන්න පැහැදිලි කර එහි විවිධ ආකාර දක්වන්න.

9) පහත වගුව සම්පූර්ණ කරන්න.

| තිරිඟු නිෂ්පාදනය | සහල් | තිරිඟු ආ/පි | සහල් ආ/පි |
|---|---|---|---|
| 0 | 200 | | |
| 10 | 180 | | |
| 20 | 150 | | |
| 30 | 110 | | |
| 40 | 60 | | |
| 50 | 0 | | |

10) ආවස්ථික පිරිවැය සැම විටම ඍණ අගයක් ගැනීමට හේතුව කුමක් ද ?

11) පහත සඳහන් අවස්ථා නි.හැ.මා වක්‍ර ඇසුරෙන් ඉදිරිපත් කරන්න.

- සම්පත් පූර්ණ ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම
- සම්පත් අකාර්යක්ෂම ලෙස උපයෝජනය
- සම්පත් අකාර්යක්ෂම භාවිතයක සිට කාර්යක්ෂම වීම
- හිඟකම
- සේවා වියුක්තිය
- ආවස්ථික පිරිවැයකින් තොරව නිෂ්පාදනය වැඩි කිරීම
- ආවස්ථික පිරිවැයකින් තොරව නිෂ්පාදනය වැඩි කිරීම
- ආවස්ථික පිරිවැයකින් තොරව භාණ්ඩ දෙකෙහිම නිෂ්පාදනය වැඩි කිරීම

12) නි.හැ.මා වක්‍රය විතැන් වීමට බලපාන හේතු මොනවාද ?

13) ආර්ථික වෘද්ධිය යනු කුමක් ද ? ආර්ථික වෘද්ධිය නි.හැ.මා වක්‍රය ඇසුරෙන් පෙන්වන්නේ කෙසේද ?

14) නිෂ්පාදන කාර්යක්ෂමතාව හා ආර්ථික කාර්යක්ෂමතාව නි.හැ.මා වක්‍රයක පෙන්වන්නේ කෙසේද ?

15) යම් කිසි ආර්ථිකයක් සමාජයේ මිනිසුන්ට වඩාත් ගැලපෙන නිමැවුම් සංයෝගය තෝරා ගැනීමේදී.................................................... විශ්ලේෂනයක යෙදිය යුතුය.